# යටත්විජිතවාදයේ ඇඟිලි සලකුණු

අද මෙරට ආණ්ඩුවක් ඇත්තේ නැත. ඒ බව අප කිහිප විටක්ම පවසා ඇත. බටහිර ක්‍රිස්තියානි යටත්විජිතවාදය ලංකාවේ තරම් ක්‍රියාත්මක වන රටවල් ඇත්නම් ඒ කිහිපයක් පමණක් විය යුතුය. බ්‍රිතාන්‍යයට යෑම සඳහා වීසා ලබාගැනීමට යන අයගෙන් බ්‍රිතාන්‍ය මහකොමසාරිස් කාර්යාලය ඇඟිලි සලකුණු ලබා ගනියි. මේ පිළිබඳව විදේශ ඇමැති ටිරෝන් ප්‍රනාන්දු මහතා කියා තිබුනේ මිත්‍ර රටක් ඇඟිලි සලකුණු ලබාගැනීමට ඉල්ලූ කල එයට එකඟ නොවී බැරි බවය. මෙහි කිසිදු සත්‍යතාවයක් නැත. බ්‍රිතාන්‍යය ඉන්දියාවෙන් මෙවැනි ඉල්ලීමක් කෙළේ නම් එයට ඉන්දියානුවන් කිසි ලෙසකින්වත් එකඟ නොවනු ඇත. ඒ ඉන්දියාව බ්‍රිතාන්‍යයේ මිත්‍ර රටක් නොවන නිසා නොවේ. ඉන්දියාවේ නායකයන් ලංකාවේ ඊනියා නායකයන් මෙන් නිවට නොවන බැවින් එරට වැසියන්ට අපරාධකරුවන්ට මෙන් ඇඟිලි සලකුණු දීමට සිදු නොවේ. බ්‍රිතාන්‍යය කියනු ඇත්තේ ඔවුන් ඇඟිලි සලකුණු ගන්නේ ලාංකිකයන්ගෙන් නොව ලංකාවේ සිට වීසා සඳහා ඉල්ලුම් කරන්නන්ගෙන් බවය. එහෙත් මේ කතා සුපුරුදු බ්‍රිතාන්‍ය රාජ්‍ය තාන්ත්‍රික උප්පරවැට්ටි පමණකි. ලංකාවේ සිට බ්‍රිතාන්‍යයට ඇතුල්වීම සඳහා වීසා ගැනීමට ඉල්ලුම් කරන්නන්ගෙන් අති විශාල බහුතරය මෙරට ජනයා බව නොදන්නේ බ්‍රිතාන්‍ය මහා කොමසාරිස් කාර්යාලයම පමණක් විය යුතුය.

බ්‍රිතාන්‍යය විසින් ලංකාව ආරක්ෂාකාරී රටක් ලෙස නම් කරනු ලැබීමෙන් පසු මෙසේ ඇඟිලි සලකුණු ගැනීමට තීරණය කිරීම එතරම් පුදුමයට කරුණක් ද නොවේ. ඒ බ්‍රිතාන්‍ය රාජ්‍ය තාන්ත්‍රිකභාවයයි. අද දෙමළ ජාතිවාදී ත්‍රස්තවාදීන්ගෙන් බටහිරට පැන ගැනීමට අවශ්‍ය ව තිබූ අය එහි ගොස් හමාරය. ඔවුහු ඇඟිලි සලකුණු නොදීම ඊනියා දේශපාලන සරණාගතයන් ලෙස බටහිර රටවලට පැනගත්හ. ඔවුහු අද කිසිම කරදරයකින් තොරව බොහෝ විට රාජ්‍ය ආධාර ලබමින් බ්‍රිතාන්‍යය ඇතුළු බටහිර රටවල වාසය කරති. දෙමළ ත්‍රස්තවාදීන්ට බ්‍රිතාන්‍යයට ඒමට අවසර දී ඔවුන්ට රැකවරණ දුන් බ්‍රිතාන්‍ය ආණ්ඩුව අද සාමාන්‍ය ජනයාට දරුණු අපරාධකරුවන්ට මෙන් සලකයි. මේ නිවට නායකයන් හමුවේ බටහිර ක්‍රිස්තියානි යටත්විජිතවාදය ක්‍රියාත්මක වන ආකාරයය. අද උතුරේ සහ නැගෙනහිර ක්‍රියාත්මක වන දෙමළ බෙදුම්වාදී ත්‍රස්තවාදය මුළුමනින්ම මෙන් බටහිර ක්‍රිස්තියානි යටත්විජිතවාදයේ අනුග්‍රහය නිසා පවතියි. මේ බටහිර යටත්විජිතවාදය පිළිබඳ ව ඇති බටහිරම නිපදවන මාක්ස්වාදී විවේචනවලින් ඔබ්බට ගොස්, එනම් ඉන් මුළුමනින්ම ඉවත් වී ඒ දෙස බැලීමට අප පුරුදු විය යුතුය. අප විටින් විට ඉඩ ලැබෙන ආකාරයට ඒ පිළිබඳව ඉරිදා දිවයින, විදුසර හා අයිලන්ඩ් යන පුවත්පත්වලින් හා සාකච්ඡා සම්මන්ත්‍රණ ඔස්සේ කරුණු ඉදිරිපත් කරමු. ගණනාත් ඔබේසේකර මහතාගේ හෘදය සාක්ෂිය පිළිබඳව ද අප විමසන්නේ එහි එක් කොටසක් ලෙසය.

අප බොහෝවිට කියා ඇති පරිදි බටහිර යටත්විජිතවාදයෙහි සංරචක තුනක් වෙයි. ඒ දේශපාලන, ආර්ථික හා සංස්කෘතික යනුවෙනි. ඒ සංරචක එකිනෙකින් ස්වායත්ත බවක් හෝ අන්‍යෝන්‍ය වශයෙන් බහිෂ්කාර බවක් හෝ මෙයින් නොකියැවෙයි. අප මේ දෙස බලන්නේ අපේ ප්‍රවාද ඔස්සේ මිස බටහිරයන් නිපදවන මතිමතාන්තර ඔස්සේ නොවේ. ඒ බව ඇතැම් අනුකාරකයන්ට තවමත් නොතේරෙයි. නූතනත්වය, යටත්විජිතවාදය, ධනවාදය ආදිය පිළිබඳව අප දක්වන අදහස් බටහිර සාම්ප්‍රදායික අදහස්වලට බෙහෙවින් වෙනස්ය. බටහිර සාම්ප්‍රදායික අදහස් දළ වශයෙන් වාමාංශික හා දක්ෂිණාංශික යනුවෙන් බෙදෙයි. මාක්ස්වාදය වාමාංශික වන අතර ලිබරල්වාදය දක්ෂිණාංශික වෙයි. වාමාංශික හා දක්ෂිණාංශික අදහස් අතර ඉතා මූලික වෙනස්කම් තිබුනද, ඒ සියල්ල ඉදිරිපත් කෙරෙන්නේ බටහිර ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තනය මත පදනම් වෙමිනි. චින්තනය යන්න මෙරට නිර්මාණය වූ දේශජ සංකල්පයකි. එය කිසිසේත්ම සිතීම නොවේ. ඇතැම් කුහක ප්‍රවාද චෞරයකු චින්තනය යන්න දකුණු අප්‍රිකාවට උරුම කිරීමට උත්සාහ කළ ද ඔවුන්ට ඒ සඳහා අබමල් රේණුවක තරමවත් සාක්ෂි ඉදිරිපත් කළ හැකි නොවේ. පශ්චාත්නූතනවාදය ඉදිරියේ වැඳ වැටී පශ්චාත්නූතනවාදීන් සමඟ ඇයිහොඳයිකම් පැවැත්වූ මේ චෞරයෝ අප පශ්චාත්නූතනවාදයට එරෙහිව ප්‍රවාද ගොඩ නැගීමෙන් පසුව වීරයන් මෙන් පශ්චාත්නූතනවාදීන්ට තඩිබාති.

දැනුම නිර්මාණය පමණක් නොව සංගීතය, කලාව, විද්‍යාව, ආදී ජනතාවකගේ පොදු මානසික කටයුතු බැඳ තබන හුය චින්තනය වෙයි. ඒ කටයුතු චින්තනයට ඌනනය කළ හැකි බවක්වත් චින්තනය යන්න වෙනස් නොවන බවක්වත් මෙයින් නොකියැවෙයි. චින්තනයද වෙනස්වන අතර අවශ්‍ය පරිදි ඇතැම් අවස්ථාවල වෙනස් කළ හැකිය. ලෝකයේ සිදු වී ඇති චින්තන පෙරළි අතර බෞද්ධ චින්තන විප්ලවය ද පහළොස්වැනි සියවසේ යුරෝපයේ ඇති වූ චින්තන

© Prof. Nalin De Silva

විප්ලවය ද වෙයි. බටහිර ක්‍රිස්තියානි යටත්විජිතවාදය මෙන් ධනවාදය බටහිර විද්‍යාව නවකථාව ආදී දෑ ද පහළොස්වැනි සියවසේ නිර්මාණය වූ බටහිර ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තනයෙහි ප්‍රතිඵල වෙයි. නූතනත්වයද එහි ම ප්‍රතිඵලයකි. අප නූතනත්වයෙහි ආරම්භය දකින්නේ බොහෝ බටහිරයන් මෙන් දහඅටවැනි සියවසේ ඊනියා ප්‍රතිසංස්කරණය තුළ නොව පහළොස්වැනි සියවසේ ඇතිවූ ඊනියා පුනරුදය තුළය. ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය යනු පුනරුද ක්‍රියාවලිය ඉදිරියට ගෙන යෑමක් විය. ඊනියා පශ්චාත්නූතනවාදය බටහිර නූතනත්වය ම ආත්ම කොට ගත්තේ වෙයි. නූතනත්වය තුළ සිදු වූ ඉලෙක්ට්‍රොනික විප්ලවය හමුවේ බටහිර සමාජයේ වර්ධනය තේරුම් ගැනීමට කරන උත්සාහයක් පශ්චාත්නූතනවාදය පිළිබඳ ප්‍රවාදවල වෙයි. එමෙන්ම එමගින් ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තනයෙහි බංකොළොත් බවද හෙළිවෙයි.

පහළොස්වැනි සියවසේ සිට අද දක්වා ම බටහිර ක්‍රිස්තියානි යටත්විජිතවාදය ක්‍රියාත්මක වෙයි. එහි දී එක් එක් කාලවල ඒ ඒ සංරචක ප්‍රධානත්වය ගෙන ඇත. වර්තමානයෙහි ප්‍රධාන සංරචකය වී ඇත්තේ සංස්කෘතික සංරචකය ය. අද ඇමරිකාව හා බ්‍රිතානිය ප්‍රමුඛ ඇංග්ලො සැක්සන් ක්‍රිස්තියානි හා ලුතර්වාදී රටවල් ලෝකය පාලනය කිරීමට උත්සාහ කරන්නේ ප්‍රධාන වශයෙන්ම බටහිර යටත්විජිතවාදයේ සංස්කෘතික සංරචකය මත පදනම් වෙමිනි. බටහිර සංස්කෘතික යටත්විජිතවාදය යනු හුදෙක් අනෙක් සංස්කෘතීන් නැති කිරීම නොවේ. එහි ඊට වැඩි දෙයක් වෙයි. බටහිර සංස්කෘතිය අනෙක් රටවල්, ජාතීන් හා ජනවර්ග මත බලයෙන්, උපක්‍රමයෙන් ආදී වශයෙන් පැටවීම සංස්කෘතික යටත්විජිතවාදය වෙයි.

අප රටේ අධ්‍යාපනය, ජනමාධ්‍ය, කලාව, සංගීතය ආදිය මේ සංස්කෘතික සංරචකය ක්‍රියාත්මක වන ක්ෂෙත්‍ර වෙයි. එය අප රටට පමණක් නොව බටහිර ක්‍රිස්තියානි යටත්විජිතවාදයට ගොදුරු වූ සියළු රටවලට උරුම වූ කරුමයක් වී ඇත. ගණනාත් ඔබේසේකරලා මෙන්ම හඳගමලාද සමන් වික්‍රමාරච්චිලාද බටහිර සංස්කෘතික යටත්විජිතවාදයේ ඒජන්තයන් වන්නේ ඒ අයුරුනි. මේ ඇතැමුන් බටහිර විචේචකයන්, රැඩිකල්වාදීන් මෙන් පෙනී සිටිනවා විය හැකිය විශේෂයෙන් ම ධනපති ක්‍රමයේ විවේචකයන් ලෙස ඇතැම්හු පෙනී සිටිති. මාක්ස්වාදීන් ඇතැම් පශ්චාත්නූතනවාදීන් අරුන්දතී රෝයිලා හා සලමන් රුෂ්ඩිලා මේ ඝනයට අයත් වෙති. මේ වාමාංශිකයෝ හා රැඩිකල්වාදීහු දක්ෂිණාංශිකයන්ගේ අනුපූරකය (කොම්ප්ලිමන්ට්) පමණක්ම වෙති. මේ අනුපූරක කතාව මෙයට ඉහතදී විශේෂයෙන්ම අයිලන්ඩ් පුවත්පත ඔස්සේ කියා ඇත. රෝයි රුෂ්ඩි වන්දනාකරුවන් බොහෝමයක් ඇත්තේ ඉංගිරිසි කතාකරන්නන් අතරය.

ඊනියා රැඩිකල්වාදීන් හා දක්ෂිණාංශිකයන් එකිනෙකාගේ අනුපූරක වන්නේ ඔවුන් සියළු දෙනාම බටහිර ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තනය මත පදනම්වන බැවිනි. ඔවුන් සියළු දෙනාගේ චින්තනය පමණක් නොව දැනුම නිර්මාණය සම්බන්ධයෙන් ගත් කල සුසමාදර්ශය ද එකක් ම වෙයි. මේ චින්තන ඒකත්වය නිසාම මොවුහු වෙනත් සංස්කෘතීන් විශේෂයෙන්ම උපතින්ම හෝ හැදී වැඩීමෙන් තමන් හිමිකර ගත් සංස්කෘතීන් බටහිර ඇසින් බලා විවේචනය කරති. එසේ විවේචනය කළ වහාම ඔවුන්ට බටහිරට සංස්කෘතිය තුළ පිළිගැනීමක් ලැබෙයි. අරුන්දතී රෝයිලා බටහිර විවේචනය කරන අතරම බටහිර පිළිගැනීමට ලක්වන්නේ එබැවිනි. අප රටේ ද කිරිට්න් ප්‍රමාණයේ රුෂ්ඩිලා හා රෝයිලා දැකගත හැකිය. ඔවුන්ට ද ඒ පමණින්ම පිළිගැනීමක් ලැබෙයි. ඔවුන්ට විවිධ තෑගි, තනතුරු පිරිනැමෙන්නේ ඔවුන්ගෙන් බටහිර සංස්කෘතික යටත්විජිතවාදයට ඉටුවන සේවය අනුවය.

රුෂ්ඩිලා ගැන පමණක් නොව රවීන්ද්‍රනාත් තාගෝර් තුමා සත්‍යජිත් රායි. රවි ශංකර් ආදීන් ගැන ද අපට නැවත සිතීමට සිදුවෙයි. ඔවුන් ඇත්තටම සිදු කෙළේ සිදු කරන්නේ කුමක් ද? ඔවුහු බටහිර සංස්කෘතිකාංග භාරතීය සංස්කෘතිය තුළට අවශෝෂණය කළෝ ද එසේ නැත්නම් එළුහරකා මීහරකා බඳින්නාක් මෙන් බටහිර සංස්කෘතිය හා භාරතීය සංස්කෘතිය එකට ගැට ගැසීමට උත්සාහ කළෝ ද? එහි ප්‍රතිඵලය කුමක් වී ද? සත්‍යජිත්රායි බෙංගාලි ජනසමාජය විවේචනය කරන්නේ භාරතීය සංස්කෘතිය තුළ නොව බටහිර ඇසකින් බැලීමෙනි. ඔහුගේ සිනමාවේ ඇත්තේ භාරතීය චින්තනයක් නොව බටහිර චින්තනයකි. ඇතැම් භාරතීයයන් අතින් තාගෝර් තුමාද විවේචනයට ලක් වූ බව අමතක නොකළ යුතුය. එතුමාට නොබෙල් ත්‍යාගය නිකම්ම ලැබුණේ යැයි සිතන්නේ නම් එහි වරදක් වෙයි. තාගෝර්තුමා විවේචනයට ලක් කළ වුන් හුදු සංස්කෘතික මූලධර්මවාදීන් ලෙස හැඳින්වීම බටහිර සංස්කෘතික යටත්විජිතවාදීන්ගේ ම ලක්ෂණයක් වෙයි. ඊනියා මූලධර්මවාද සූත්‍රගත වන්නේ බටහිර සංස්කෘතික හා චින්තන

© Prof. Nalin De Silva

ආධිපත්‍යය තුළය. තාගෝර්තුමා භාරතීය සංස්කෘතිය ගැන කතාකළ බව සැබෑය. එහෙත් එතුමාට බටහිර සංස්කෘතිය භාරතීය සංස්කෘතිය තුළට අවශෝෂණය කිරීම පිළිබඳ දැනුමක් හෝ හැඟීමක් හෝ වී යැයි කිව නොහැකිය අප රටේ ඊට අඩු මට්ටමකින් වුවද මාර්ටින් වික්‍රමසිංහ මහතා කළ කාර්යය හා සැසඳීමෙන් ඒ පිළිබඳ යම් අවබෝධයක් ලබාගත හැකිය. පැරැණි සිංහල සංස්කෘතියෙහි සාධනීය මෙන්ම අදීන අංග ගැන ද අපට කියා දුන් එතුමා බටහිර නවකතාව කෙටිකතාව විද්‍යාව ආදිය හමුවෙහි. අසරණ විය. ඒ අංග සිංහල සංස්කෘතියට අදීනව අවශෝෂණය කිරීම ගැන ඒ මහතා නොසිතුවේය.

අපේ සංස්කෘතීන් විවේචනය නොකළ යුතු යැයි මෙයින් නොකියැවෙයි. අප ඒ විවේචනය කළ යුතුය. එහෙත් එසේ කළ යුත්තේ බටහිර ඇසකින් බලා නොවේ. අප අපේ සංස්කෘතීන් ඒ තුළම විවේචනය කළ යුතුය. බටහිර අදහස් උදහස් අප භාර ගත යුත්තේ ඒ අපේ සංස්කෘතිය තුළට අවශෝෂණය කිරීමෙන් පසුව පමණකි. සරත් අමුණුගම මහතාට නොතේරෙන මේ කරුණ අපි පසුව තවදුරටත් පේරාදෙණි විශ්වවිද්‍යාලයේ ඊනියා සුන්දර ගොඩනැගිලි හා ඒ ගොඩනැගිලි තුළ ඉගැන්වෙන දෑ සම්බන්ධ කර ගනිමින් සාකච්ඡා කරමු. ගුණදාස අමරසේකර මහතාට කලක් උයනක් ලෙස පෙනුණු පේරාදෙණි සරසවි බිම පසුව පෙනුණේ මරු කතරක් ලෙසය.

බටහිරයන් පිළිගැනීමක් ලබා දෙන්නේ තමන්ට අවශ්‍ය දෙය කරන කලාකරුවන්ට හා අනෙක් ශාස්ත්‍රීන්ට පමණක් නොවේ. දේශපාලනඥයන් සම්බන්ධයෙන් ද එය එසේමය භාරතයේ ගාන්ධිතුමාට අවසානයේ දී පිළිගැනීමක් ලබා දුන්නේ ඇයි ද යන්නත් සුභාෂ් චන්ද්‍රබෝෂ් වැන්නන අමතක කෙරුණේ කෙසේද යන්නත් අපේ අවධානයට යොමු විය යුතුය. මේ සියල්ල පිළිබඳව ඉඩ ලැබෙන අයුරින් සාකච්ඡා කරමු. මෙරට ඊනියා නායකයන් බ්‍රිතාන්‍යන්ට කෙතරම් විශ්වාසවන්ත වී ද යතහොත් අපට යටත්විජිතවල මුලින්ම සර්වජන ඡන්දය ලබා දීමට ඔවුහු ක්‍රියා කළහ. අද ඉන්නේ ද අප බොහෝ විට කියා ඇති පරිදි බ්‍රිතාන්‍යන් අප වෙනුවෙන් තෝරාගත් ඊනියා නායකයන්ගෙන් පැවත එන එවැනිම වූ තෝරාගත් පිරිසකි. ඔවුන් බ්‍රිතාන්‍යයට අවශ්‍ය අන්දමට ඇඟිලි සලකුණු ලබා ගැනීමට ඉඩ දීම පුදුමයක් නොවේ.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva